2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතෙහි හඳුනාගත් විශේෂ කරුණු

TAX TALK
YOUR PARTNER IN TAX

Ranaweera Associates
Chartered Accountants

Assent Advisory Partners

Assent Secretarial Consultants

ATHULA RANAWEERA (BSc., FCA, FCMA, FMAAT)
email – athula@assentadvisory.lk, athula@ranaweeraasso.lk
Phone – +94 777 305 123

31st May 2021

දේශීය ආදායම් (සංශෝධන) පනත හැඳින්වීම

TAX TALK
YOUR PARTNER IN TAX

- පනත් කෙටුම්පත 2021.03.18 දින නිකුත් කරන ලදී.
- ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය (Determination) 2021.04.07 දින ලබා දී ඇත.
- කාරක සභා මට්ටමේ සංශෝධන පනත් කෙටුම්පතට ඇතුළත් කරන ලදී.
- 2021.05.04 දින පාර්ලිමේන්තුවේදී පනත සම්මත කරන ලදී.
- 2021.05.13 දින **2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** ලෙස සහතික කර ඇත.

දේශීය ආදායම් (සංශෝධන) පනත
සංශෝධන පිළිබඳ සාකච්ඡා අනුපිළිවෙල (Index)

TAX TALK
YOUR PARTNER IN TAX

- රඳවා ගැනීම් බද්ද (වේතන සහ වෙනත් ගෙවීම් මත) **Slide 4 – 7**
- ඉඩදිය හැකි සහ ඉඩදිය නොහැකි අඩු කිරීම් **Slide 8 – 11**
- බදු නිදහස් ආදායම් **(Tax Holidays/Exemptions)** **Slide 12 – 23**
- **Covid-19** ආර්ථික ප්‍රතිසාධන විශේෂ බදු සහන **Slide 24 – 25**
- සහන සහ සුදුසුකම් සහිත ගෙවීම් **(Reliefs & Qualifying Payments)** **Slide 26 – 29**
- සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – පුද්ගලයින් **Slide 30 - 31**
- සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – හවුල් ව්‍යාපාර **Slide 32**
- සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – භාරයන් **Slide 33**
- සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – සමාගම් **Slide 34 – 36**
- අවසානය **Slide 37**

දේශීය ආදායම් (සංශෝධන) පනත
1. වේතන මතවූ රඳවා ගැනීමේ බද්ද - WHT (PAYE/APIT)

TAX TALK
YOUR PARTNER IN TAX

(i) වාසික / නිර්වාසික / ශ්‍රී ලංකාවේ පුරවැසි නොවන සේවකයින්ගේ වේතන; (Sec. 83 & 83A)

කාලය	රඳවා ගැනීමේ බදු වගකීම	
	වාසික / ශ්‍රී ලංකා පුරවැසියන් වන	නිර්වාසික/ ශ්‍රී ලංකා පුරවැසියන් නොවන
01.04.2018 – 31.12.2019	PAYE සඳහා බැඳී සිටී	PAYE සඳහා බැඳී සිටී
01.01.2020 – 31.03.2020	වගකීමක් නැත	වගකීමක් නැත
01.04.2020 සිට	ස්වේච්ඡා පදනමින් APIT සඳහා බැඳී සිටී	අනිවාර්ය පදනම මත APIT සඳහා බැඳී සිටී

(ii) සේවක විශ්‍රාමික ප්‍රතිලාභ (Terminal Benefits) (Sec. 84 & 84A);

ඕනෑම සේවකයෙකුගේ විශ්‍රාමික ප්‍රතිලාභ මතවූ WHT වගකීම 01.01.2020 දින සිට ඉවත් කර ඇත.

දේශීය ආදායම් (සංශෝධන) පනත
1. වෙනත් ගෙවීම් මතවූ රඳවා ගැනීමේ බද්ද (WHT)

TAX TALK
YOUR PARTNER IN TAX

(i) වාසිකයින් සඳහා කරනු ලබන ගෙවීම්;

- 01.01.2020 වන දින සිට **වාසික තැනැත්තෙකුට** (To resident person) කරනු ලබන පහත ගෙවීම් සඳහාවූ **රඳවා ගැනීමේ බදු වගකීම** අහෝසි කර ඇත.

(a) ලාභාංශ
(b) පොළී
(c) වට්ටම්
(d) ගාස්තු
(e) කුලිය
(f) රාජ්‍යභාර ගෙවීම්
(g) ස්වාභාවික සම්පත් සඳහා ගෙවීම්
(h) වාරිකමුදල් හෝ විශ්‍රාම ගෙවීම්
(i) පුද්ගලයෙකු විසින් කරනු ලබන සේවාවන් සඳහා ගෙවනු ලබන සේවා ගාස්තු

- **වාසික බදු ගෙවන්නන් සඳහා <u>අත්තිකාරම් ආදායම් බදු</u> (AIT) හඳුන්වා දීම –**
01.04.2020 වන දින සිට ඉහත ගෙවීම් හෝ ඒ හා සමාන වරින් වර කරනු ලබන ගෙවීම් සඳහා–වාසික බදු ගෙවන්නාට AIT (අත්තිකාරම් ආදායම් බදු) අඩු කිරීම සඳහා ගෙවීම් කරනු ලබන නියෝජිතයින්ගෙන් ඉල්ලීම් කළ හැකිය. [Sec. 84A]

දේශීය ආදායම් (සංශෝධන) පනත
1. වෙනත් ගෙවීම් මතවූ රඳවා ගැනීමේ බද්ද (WHT) (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

වාසිකයින් සඳහා කරනු ලබන ගෙවීම් (තවදුරටත්)

- ඕනෑම **තැනැත්තෙකුට** (To any person) කරනු ලබන පහත සඳහන් ගෙවීම් සඳහා රඳවා ගැනීමේ බදු වගකීම තවදුරටත් එලෙසම **ක්‍රියාත්මක** වේ.

ආදායම් ප්‍රභවය (ගෙවීම)	WHT %
ලොතරැයියකින්, ඔට්ටු ඇල්ලීමකින් හෝ සූදුවකින් ලබන ජයග්‍රහණ සඳහා ගෙවීම්	14%
NGJA විසින් කරනු ලබන වෙන්දේසියකදී ඕනෑම තැනැත්තෙකු විසින් විකුණන ලද මැණික් සඳහා කරනු ලබන ගෙවීම්	2.5%

- **හවුල්කාරිත්ව ප්‍රතිපාදන මත WHT;**

  හවුල්කරුවකුගේ බෙදාවෙන්කල හවුල්කාර කොටස මත අය කළ **8% WHT** 01.01.2020 වන දින සිට අහෝසි කල අතර 01.01.2020 වන දින සිට හවුල් ව්‍යාපාර සඳහා 6% ක ආදායම් බද්දක් හඳුන්වා දී ඇත.

දේශීය ආදායම් (සංශෝධන) පනත
1. වෙනත් ගෙවීම් මතවූ රඳවා ගැනීමේ බද්ද (WHT)

TAX TALK
YOUR PARTNER IN TAX

(ii) නිර්වාසිකයින් සඳහා කරනු ලබන ගෙවීම්;

ආදායම් ප්‍රභවය (ගෙවීම)	WHT %	WHT වගකීම ඇත / නැත
(a) (i) පොලී*- ලබාදුන් කුමන හෝ ණය මත, ශ්‍රී.ල.ම.බැංකුව අනුමත විදේශීය මුදල් බැංකු තැම්පතු මත, "විශේෂ තැන්පතු ගිණුම්" මත.	5%	නැත [නිදහස් කර ඇත – උපලේඛන 3 - අයිතම (i)(ii)]
(ii) ඉහත ආවරණය නොවූ පොලී සහ වට්ටම්.	5%	අයවිය යුතුය
(b) ලාභාංශ, ගාස්තු, ස්වාභාවික සම්පත් මත ගෙවීම, කුලිය, පුරස්කාර ගෙවීම්, වාරිකය, සේවා ගාස්තු හෝ රක්ෂණ වාරිකයක්.*	14%	නැත [නිදහස් කර ඇත– උපලේඛන 3-අයිතම(oo)(ii)]
(c) ඕනෑම තැනැත්තෙකු විසින් විකුණන මැණික් සඳහා ගෙවීම්	2.5%	අයවිය යුතුය
(d) සේවා ගාස්තු (ගොඩබිම්, මුහුදු, ගුවන් ප්‍රවාහනය හෝ විදුලි සංදේශ)	2%	අයවිය යුතුය
(e) භවුල්කරුවකුගේ බෙදාවෙන්කල ලාභ කොටස	N/A	වගකීමක් නැත

- ***Sec. 85(1A)** යටතේ, නිර්වාසිකයින්ට ගෙවන ඉහත අයිතම **(a)(i)** සහ **(b)**, **WHT** සඳහා යටත් වුවත්, **3** වන උපලේඛනය - අයිතම **[(i)(ii) & (oo)(ii)]** යටතේ ඒවා නිදහස් කර ඇති බැවින් **WHT** අඩු නොකෙරේ.*
- ****නිර්වාසිකයන්ගේ ඉහතින් ආවරණය නොවූ තැන්පතු පොලී, බද්දට යටත් කිරීමේ හේතුව පැහැදිලි නැත.***
- ***01.01.2020** වන දින සිට භවුල්කරුවකුගේ බෙදාවෙන්කල ලාභ කොටස මතවූ **8% WHT** අහෝසිකර ඇත.*

දේශීය ආදායම් (සංශෝධන) පනත
2. ඉඩදිය හැකි සහ ඉඩදිය නොහැකි වියදම් (Sec. 11 & 10)

TAX TALK
YOUR PARTNER IN TAX

2.1. සාමාන්‍යයෙන් ඉඩදිය හැකි සහ ඉඩදිය නොහැකි දෑ (Sec. 10 & 11)

<u>ව්‍යාපාරයකින්</u> හෝ <u>ආයෝජනයකින්</u> යම් තැනැත්තෙකුට ලැබෙන ආදායම ගණනය කිරීමේ දී, එම තැනැත්තා විසින් එම වර්ෂය තුළ දී එම ආදායම් ලබාගැනීම <u>සඳහා දරන ලද වියදම්</u>, අඩු කිරීමට ඉඩ දේ.

කෙසේ වෙතත්, 11 වගන්තිය යටතේ ප්‍රාග්ධන වියදම් (මාස 12 වැඩි කාලයක් ප්‍රතිලාභ ලැබෙන) ඉඩ නොදේ.

වගන්ති අංක 11හි කෙසේ සඳහන් වුවත් වගන්ති අංක 10 යටතේ විශේෂයෙන් ඉඩදිය නොහැකි ලෙස ඇතැම් වියදම් ලයිස්තුගත කර ඇති අතර, වගන්ති 11 යටතේ ආවරනය නොවුවත් විශේෂයෙන් ඉඩදී ඇති වියදම් රැසක් වගන්ති අංක 12 සිට 18 දක්වා ආවරනයකර බදු සඳහා ඉඩදී ඇත.

<u>2021 දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් කර ඇති අදාළ වෙනස්කම් පහත දැක්වේ</u>;

2.2 පාරිතෝෂික අරමුදල් සඳහා දායකත්වය – Sec. 10 (1) (b) (v)

රැකියා ආදායම යටතේ බදු නොවන, සේවා යෝජකයන් විසින් පාරිතෝෂික අරමුදල් සඳහා කරන දායකත්වයන්ද ඉඩ දිය නොහැකි ලැයිස්තුවට අලුතින් ඇතුළත් කර ඇත. [එය රැකියා ආදායමක් වුවද, Sec. 5(3)(f) යටතේ විශේෂයෙන් බැහැර කර ඇති බැවින් බදු අයනොකෙරේ].

දේශීය ආදායම් (සංශෝධන) පනත
2. ඉඩදිය හැකි සහ ඉඩදිය නොහැකි වියදම් (තවදුරටත්) (Sec. 11 & 10)

TAX TALK
YOUR PARTNER IN TAX

2.3 අරමුදල් පිරිවැය – Sec. 11 (4)

වෘත්තීය අධ්‍යාපනයක් සාර්ථකව නිම කරන ලද ඕනෑම පුද්ගලයෙකු විසින් 2021.04.01 දින හෝ ඊට පසුව ආරම්භ කරන ලද නව ව්‍යාපාර සඳහා ලබා දී ඇති ණය සඳහා මූල්‍ය ආයතන විසින් දරන ලද අරමුදල් පිරිවැය ඉඩ දිය හැකි වියදමක් වේ.

[Sec.11 මගින් එය ඉඩදිය හැකි වියදමක් වනබැවින් අලුතින් ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය ගැටලු සහගතය].

2.4 අළුත්වැඩියා සහ වැඩිදියුණු කිරීම් – Sec. 14

2021.04.01 දින සිට ඉඩදිය හැකි වියදම් සඳහාවූ උපරිම සීමාව [ක්ෂය කළ හැකි ගොඩනැගිලිවල ලියාහල අගයෙන් (WDV) 5% ක් සහ වෙනත් දේපල පිරියත හා උපකරණවල ලියාහල අගයෙන් 20%] අදාළ වන්නේ වැඩිදියුණු කිරීමේ පිරිවැය ට පමණි. *(අලුත්වැඩියා සඳහා උපරිම සීමාවක් අදාළනොවේ)*

2.5 අලෙවිකරණ සහ සන්නිවේදන වියදම් සඳහා 200% අඩු කිරීමේ පහසුකම – Sec. 15A

2021.04.01 දින සිට, ඕනෑම තැනැත්තෙකුගේ තක්සේරු වසරක් සඳහාවූ ව්‍යාපාර ආදායම ගණනය කිරීමේදී **අලෙවිකරණ සහ සන්නිවේදන වියදම් සඳහා** <u>අතිරේක අඩු කිරීමකට</u> හිමිකම් ලැබෙනු ඇත. එය එහි ස්වභාවය නොසලකා අඩු කරනු ලබන මුළු අලෙවිකරණ හා සන්නිවේදන වියදම්වලින් 100% කි. කෙසේ වෙතත්, ඒ සඳහා <u>කොන්දේසි</u> කිහිපයක් සපුරාලිය යුතුය.

දේශීය ආදායම් (සංශෝධන) පනත
2. ඉඩදිය හැකි සහ ඉඩදිය නොහැකි වියදම් (තවදුරටත්) (Sec. 11 & 10)

TAX TALK
YOUR PARTNER IN TAX

2.6 පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා 200% අඩු කිරීම වසර 2 කින් දීර්ඝ කරන ලදි.

මෙම අඩු කිරීම තවත් වසර 02 කින් දීර්ඝ කර ඇත.*(එමගින් ත.ව.2021/22 සහ 2022/23 ද, ආවරණය වේ)*

2.7 මූල්‍ය පිරිවැය – Sec. 18 (w.e.f. 01.04.2021)

නිෂ්පාදන සමාගමක් සඳහා වන මූල්‍ය පිරිවැය ඉඩදීමේ ඉහළ සීමාව ගණනය කිරීමේදී අදාළ 3 ගුණයක ශුද්ධ වත්කම් (කොටස් ප්‍රාග්ධනය + සංචිත) පදනම 4 ගුණයක් දක්වා වැඩිකෙරේ.

(ඒ අනුව, නිෂ්පාදන සහ නිෂ්පාදන නොවන, කොටස් ප්‍රාග්ධනයක් ඇති, ඕනෑම සමාගමකට හතර ගුණයක පදනම අදාළ වේ).

2.8 පාඩු – Sec. 19 (3)

මෙම සංශෝධනය මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) යටතේ අඩු බදු අනුපාතයක් අදාළ වන කාල පරිච්ඡේදයක සිට සමාගමක් ඉදිරියට ගෙන එන ලද ව්‍යාපාර අලාභයන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නොවන පසු කාල පරිච්ඡේදයක වැඩි අනුපාතයක් මත බදු වන ආදායමකින් අඩු කර ගැනීමට පහසුකම් සපයයි. (w.e.f. 01.04.2021)

දේශීය ආදායම් (සංශෝධන) පනත
2. ඉඩදිය හැකි සහ ඉඩදිය නොහැකි වියදම් (තවදුරටත්) (Sec. 11 & 10)

TAX TALK
YOUR PARTNER IN TAX

2.9 වැඩි කළ ප්‍රාග්ධන දීමනාව (Extended Capital Allowances of 100% & 200%) – (Sec. 201 & 06th Schedule)

6 වන උපලේඛනය යටතේ ක්ෂය කළ හැකි වත්කම්වල ඇමරිකානු ඩොලර් මිලියන 3 කට නොඅඩු නව ආයෝජන සඳහා (පුළුල් කිරීම් හැර) ලබා දී ඇති අතිරේක ප්‍රාග්ධන දීමනා අඩු කිරීම් තවත් වසර 02 කින් දීර්ඝ කර ඇත.

[ඒ අනුව, එය Y / A 2018/19 සිට 2024/25 දක්වාම (i.e., 2025.03.31 දක්වා) ආවරණය කරයි]

2.10 කිරි දොවන යන්ත්‍ර සඳහා ප්‍රාග්ධන දීමනාව වැඩි කිරීම (04th Schedule)

දේශීය දියර කිරි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය සඳහා භාවිතා කරන නවීන තාක්ෂණය සහිත කිරි දොවන යන්ත්‍ර, වසර 2 ක් තුළ (i.e., 50%) ක්ෂය කළ යුතුය. (w.e.f. 01.04.2018).



දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම්

TAX TALK
YOUR PARTNER IN TAX

3.1. <u>උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ</u> (Strategic Development Project Act)

- 2008 අංක 14 දරණ උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ව්‍යාපෘති සඳහාවූ (ව්‍යාපෘති සමාගම්) බදු නිදහස ආවරණය සඳහා දේ. ආ. පනත සංශෝධනය කරන ලදි. **[Sec.9(3)-IR Act]**
- *උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත (SDPA) යටතේ අනුමැතියන් ලබාදීම වසර කිහිපයකට පසු නැවත සක්‍රීය කර ඇත.*

3.2. <u>දේශීය ආදායම් පනත යටතේ</u>

3.2.1 REIT වෙත විකුණන ලද ඉඩම් හා ගොඩනැගිලි උපලබ්ධි වීමේදී ඇතිවන ලාභ- [3rd Sch.(hh)] **-**

- කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබා දී ඇති <u>දේපල හෝ ආයෝජන භාරයකට</u> (<u>Real Estate Investment Trust</u> - REIT) විකුණන ලද, හුවමාරු කරන ලද හෝ මාරු කරන ලද ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් එලෙස උපලබ්ධි කිරීමෙන් 2021.04.01 වන දින හෝ ඊට පසු තැනැත්තෙකු විසින් ලබා ගත් ලාභය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

3.2.2 ගුවන් යානා, මෘදුකාංග බලපත්‍ර හෝ වෙනත් අදාළ සේවාවන් සඳහා ගෙවීමක් ලෙස ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් නිර්වාසිකයකු විසින් ලබා ගන්නා ඕනෑම මුදලක්. (w.e.f. 01.04.2018) **[3rd Sch.(t)]**

දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

3.2.3 ඕනෑම තැනැත්තෙකු විසින් <u>පහත මූලාශ්‍රවලින්</u> උපයා ගත් හෝ ලබාගත් ලාභය; [3rd Sch.(u)]

(i) **කෘෂි ගොවිතැනෙන්** ලැබුණු නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන ආදායම 2019.04.01 දින සිට **වසර 5 ක** කාලයක් සඳහා නිදහස් කර ඇත. [කෘෂි ගොවිතැනින් ලැබෙන නිෂ්පාදනයක්, කෘෂි පිරිසැකසුම් කිරීමට හෝ කිසියම් නිෂ්පාදනයක් නිෂ්පාදනය කිරීමට යොදා ගන්නේ නම්, නිදහස් කිරීම අදාළ වන්නේ කෘෂි ගොවිතැනින් ලැබෙන නිෂ්පාදන සඳහා වන ලාභය මත පමණි. පනතේ 1 වන උපලේඛනයට කල සංශෝධනවලට අනුව, තමා විසින්ම කළ පිරිසැකසුම් ක්‍රියාවලියට / නිෂ්පාදනයට ආරෝපණය කළ **ලාභයෙන් 25%** ක්ද **නිදහස් කර ඇති අතර** ඉතිරි මුදල 14% අනුපාතය යටතේ බද්දට යටත් වේ].

(පනතේ "කෘෂි ගොවිතැන" සහ "කෘෂි පිරිසැකසුම්" අර්ථ දැක්වීම් ගැටලු සහගත වේ)

(ii) දේශීය ආදායම් කොමසාරිස් <u>විසින් නියම කර ඇති පරිදි තොරතුරු තාක්ෂණ සහ සක්‍රීය සේවා සැපයීම</u>. (w.e.f. 01.01.2020).

(iii) ශ්‍රී ලංකාව තුල හෝ පිටත සිට **කුමන හෝ සේවාවක්** විදේශයක සිටින අයට ලබාදීමෙන් උපයාගත් ලාභ. (w.e.f. 01.01.2020) එම මුදල්, විදේශ මුදලින් ලැබ, බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කළ යුතුය.

දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

(iv) ඉහත සඳහන් (iii) හැර **<u>වෙනත් ඕනෑම</u> විදේශීය ප්‍රභවයකින් උපයා ගත් හෝ ලබාගත්** විදේශ මුදල් වලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන ලද ලාභ. (w.e.f. 01.01.2020) 🤔

(v) කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සංකල්පය (TVET සංකල්පය) යටතේ ප්‍රමිතිගත කර ඇති ඕනෑම වෘත්තීය අධ්‍යාපන ආයතනයක ඕනෑම වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් වලින් ලැබෙන ආදායම්, 2021.04.01 දින සිට ආරම්භ වන වසර 5 ක කාලයක් සඳහා පහත කොන්දේසියට යටත්ව බද්දෙන් නිදහස් වේ,

- එවැනි ආයතනයක් ත. ව. (*පළමු වසර*) සඳහා වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම දෙගුණකර ඇත්නම් (*පළමු වසර තුළ දෙගුණයක් කර, ඊළඟ වසර 4 තුල එය පවත්වා ගෙන යන්නේ නම් සුදුසුකම් ලබයි*).

(vi) රත්‍රන්, මැණික් හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමෙන් <u>හෝ</u> ශ්‍රී ලංකාවට ගෙනැවිත් මැණික් කැපීම හා ඔප දැමීමෙන් පසු අපනයනය කිරීමෙන් උපයන ලද ලාභ, විදේශ මුදල්වලින්, බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇත්නම්. w.e.f. 01.04.2021

දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

3.2.4 පහත ආකාරයට ලබා ගත් මුදල්; **[3rd Sch.(v)]** (w.e.f. 01.01.2020)

(i) ඕනෑම නිර්වාසික තැනැත්තෙකු **රසායනාගාර සේවා හෝ ප්‍රමිති සහතික කිරීමේ සේවාවලින්,**

(ii) ආගමික කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ ලියාපදිංචි කර ඇති ඕනෑම **ආගමික ආයතනයක්** ප්‍රදාන හෝ පරිත්‍යාග මගින්,

3.2.5 01.04.2021 දින හෝ ඊට පසුව ආරම්භ කරන ලද කිසියම් නව කටයුත්තක් (බෙදා වෙන් කිරීමෙන් හෝ ප්‍රතිනිර්මාණය කිරීමෙන් නොවූ) කිරීමෙන් තැනැත්තෙකු විසින් ව්‍යාපාරයෙන් ලැබුනු හෝ ලබාගත් ලාභය (ප්‍රාග්ධන වත්කම් හා වගකීම් වලින් ලැබෙන ලාභ හැර) මෙහි ඇති කොන්දේසි වලට යටත්ව බද්දෙන් නිදහස් වේ; [3rd Sch.(w)]

(i) ඉදිකිරීමේ කර්මාන්තයෙහි භාවිතා කරනු ලැබ ඇති **ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය** කර විකිණීමේ නිරත ව්‍යවසායකයන්ට වසර 10 ක කාල සීමාවක් සඳහා නිදහස් කර ඇත.

තමා විසින්ම ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍ය භාවිතා කරමින් ඉදිකිරීම් සේවා සපයන අවස්ථාවක (නිශ්චිතව දක්වා නොමැති නිසා ඕනෑම තැනැත්තෙකුට අදාළ වේ)

(ii) වෘත්තීය අධ්‍යාපනය (TVET සංකල්පය) සාර්ථකව නිම කිරීමෙන් පසු පුද්ගලයකු විසින් 2021.04.01 දින හෝ ඊට පසුව **ආරම්භ කරන ලද ඕනෑම ව්‍යාපාරයක්,** වසර 5 ක කාලයක් සඳහා නිදහස් කර ඇත.

දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

(iii) වාසික තැනැත්තෙකු විසින් කරනු ලබන **බෝට්ටු සහ නැව් නිෂ්පාදන** ලාභය, වසර 7 ක කාලයක් සඳහා.

(iv) ජාතික විදුලිබල පද්ධතියට MW 100 ට නොඅඩු ධාරිතාවයක් සපයන ඕනෑම **සූර්ය හෝ සුළං බලශක්ති** (පුනර්ජනනීය බලශක්තිය) ව්‍යාපෘතියක ලාභය වසර 7 ක කාලයක් සඳහා. (නිශ්චිතව දක්වා නොමැති බැවින් ඕනෑම තැනැත්තෙකුට අදාළ වේ)

(v) 2021.01.01 දින හෝ ඊට පසු ඕනෑම වාසික තැනැත්තෙකු විසින් ආරම්භ කරන ලද **සන්නිවේදන කුළුණු සහ ඒ ආශ්‍රිත උපකරණ ඉදිකිරීම** සහ ස්ථාපනය කිරීම සහ එවැනි ඉදිකිරීම් හෝ ස්ථාපනය සඳහා **අවශ්‍ය තාක්ෂණික සේවාවන් සැපයීමෙන්** ලබන ලාභය වසර 5 ක කාලයක් සඳහා.
[“2021.01.01” දිනය, මෙම ප්‍රධාන කොටසේ (w) හි දක්වා ඇති “2021.04.01” දිනයට පටහැනි වේ]

(vi) 2021.04.01 දින හෝ ඊට පසුව කොළඹ සහ හම්බන්තොට වරායවල බන්ධිත ගුදම් හෝ අක්වෙරළ ව්‍යාපාරයට සම්බන්ධ ගුදම් බදු දීම සඳහා වන කටයුත්තක ආයෝජනය කර ඇත්නම්. (**ඕනෑම තැනැත්තෙකුට** අදාළ වන අතර අසීමිත කාලයක් සඳහා නිදහස් කර ඇත)

දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම්

TAX TALK
YOUR PARTNER IN TAX

3.2.6 ඉහත විස්තර කර ඇති ව්‍යාපාර සඳහා බදු නිදහස් කාල සීමාවන් පිළිබඳ සාරාංශයක් **[3rd Schedule(w)]**

කර්මාන්තය	බලාත්මක දිනය	නිදහස් කාල සීමාව
උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති (SDP) [Sec.9(3)-IR Act]	අනුමත පරිදි	අනුමත පරිදි
REIT වෙත විකුණන ලද ඉඩම් හා ගොඩනැගිලි උපලබ්ධි වීමේදී ඇතිවන ලාභ	01.04.2021	විවෘත
SL Airlines Ltd වෙතින් නිර්වාසිකයන්ට ලැබෙන ඇතැම් සේවා ආදායම	01.04.2018	විවෘත
කෘෂි ගොවිතැන	01.04.2019	වර්ෂ 5
තොරතුරු තාක්ෂණ සහ සක්‍රීය සේවා	01.01.2020	විවෘත
ශ්‍රී ලංකාවෙන් පිටත භාවිතා කළ යුතු දේශීය / විදේශීය සේවා	01.01.2020	විවෘත
වෘත්තීය අධ්‍යාපන ආයතන පුළුල් කිරීම (doubling students)	01.04.2021	වර්ෂ 5
රන්, මැණික්, ස්වර්ණාභරණ අපනයනය සහ අපනයනය සඳහා මැණික් සැකසීම	01.04.2021	විවෘත
නිර්වාසිකයන්ගේ රසායනාගාර සහ ප්‍රමිති සහතික කිරීමේ සේවා ආදායම	01.01.2020	විවෘත
භාවිතා කළ ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ විකිණීම/භාවිතය	01.04.2021	වර්ෂ10

දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම්

TAX TALK
YOUR PARTNER IN TAX

3.2.6 ඉහත විස්තර කර ඇති ව්‍යාපාර සඳහා බදු නිදහස් කාල සීමාවන් පිළිබඳ සාරාංශයක් [3rd Sch.(w)] (තවදුරටත්)

කර්මාන්තය	බලාත්මක දිනය	නිදහස් කාල සීමාව
සාර්ථක වෘත්තීය අධ්‍යාපනයෙන් පසුව ආරම්භ කරන ලද ව්‍යාපාර	01.04.2021	වර්ෂ 5
බෝට්ටු සහ නැව් තැනීම	01.04.2021	වර්ෂ 7
MW 100 ට නොඅඩු සූර්ය හෝ සුළං බලශක්ති ව්‍යාපෘති	01.04.2021	වර්ෂ 7
සන්නිවේදන කුළුණු ඉදිකිරීම සහ උපකරණ ස්ථාපනය කිරීම	01.04.2021	වර්ෂ 5
වරායවල බන්ධිත ගුදම් හෝ අක්වෙරළ ව්‍යාපාරයට සම්බන්ධ ගුදම් බදු දීම	01.04.2021	විවෘත

සටහන් / උපදෙස්

කිරි පිටි සැකසීම සඳහා වසර 5 ක ආදායම් බදු නිදහසක් ලබා දීමට 2021 රජයේ අයවැයෙන් යෝජනා කළද එය සංශෝධන පනතට ඇතුළත් කර නැත. 😭

දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

3.2.7. වාසික සමාගමක් විසින් ගෙවන ලාභාංශ [3rd Schedule (oo)] -

(i) ලැබුණු ලාභාංශ වලින් ඕනෑම සාමාජිකයෙකුට ගෙවන සමාගම් ලාභාංශ, (w.e.f. 01.04.2018) *(මූල් පනතට අනුව)*

(ii) නිර්වාසික සාමාජිකයෙකුට ගෙවන සමාගම් ලාභාංශ, (w.e.f. 01.01.2020) *(ලාභය වර්ගීකරණය කිරීමක් නොමැත)*

(iii) 2012 අංක 12 දරන මූල්‍ය පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජන මණ්ඩල අනුමත ආයතනයක් විසින් පහත ව්‍යාපාරයකින්/ව්‍යාපාරවලින් ඕනෑම සාමාජිකයෙකුට ගෙවන ලාභාංශ (w.e.f. 01.01.2020) (මෙමගින් ජාත්‍යන්තර වෙලඳාම සම්බන්ධ කටයුතු ආවරණය වේ (මෙමගින් **ජාත්‍යන්තර වෙලඳාම සම්බන්ධ කටයුතු** ආවරණය වේ)

- ආනයනය, සුළු සැකසුම් සහ ප්‍රති අපනයනය සම්බන්ධ වන **එන්ට්‍රෙපොට් වෙළඳාම;**
- ශ්‍රී ලංකාවට ගෙන ඒමකින් තොරව එක් රටකින් භාණ්ඩ ලබාගෙන හෝ එක් රටක නිෂ්පාදනය කර වෙනත් රටකට නැවිගත කළ හැකි **ප්‍රසම්පාදන අක්වෙරළ ව්‍යාපාර;**
- විදේශයන්හි සිටින ගනුදෙනුකරුවන්ට **අභිමුඛ සේවා සැපයීම,**
- මූල්‍ය සැපයුම් සහ බිල්පත් මෙහෙයුම් කළමනාකරණය සඳහා **ප්‍රධාන කාර්යාලය මෙහෙයුම් කටයුතු සිදුකිරීම,**
- ශ්‍රී ලංකාවේ බන්ධිත ගුදම් පහසුකම් හෝ බහුපාර්ශවීය ඒකාබද්ධ කිරීම ඇතුළු **කාර්ය සම්පාදන සේවා** සිදු කිරීම.

NOTE:- 1. ඉහත දක්වා ඇති සෑම අයිතමයක්ම (i), (ii) සහ (iii)** එකිනෙකට **ස්වාධීන වේ.

2. වාසික තැනැත්තෙකුට ලැබෙන ලාභාංශ ආදායම බද්දෙන් නිදහස් කරනු ලබන්නේ [ඉහත (i) හෝ (iii) යටතේ ආවරණය වන්නේ නම් පමණි].

දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

3.2.8 නිර්වාසික සමාගමක හරවත් (සැලකිය යුතු) සහභාගීත්වයක් (10%ක් හෝ ඊට වැඩි කොටස් හිමිකාරත්වයක් / 10% ක් හෝ ඊට වැඩි ඡන්ද බලයක්) සම්බන්ධයෙන් කිසියම් තැනැත්තෙකු විසින් ලබාගන්නා ලාභාංශ සහ එම කොටස් විකිණීමෙන් ලබාගන්නා වාසි. (w.e.f. 01.04.2018) **[3rd Schedule (r)]** *(වෙනස් කිරීමකට යටත්ව, මුල් පනත අනුව)*

3.2.9 කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර ඇති දේපල වෙළඳාම් ආයෝජන භාරයක් (REIT) කිසියම් ව්‍යාපාරයක ප්‍රාග්ධන වත්කම් හෝ ආයෝජනයන් විකිණීමෙන් ඒකක හිමිකරුවෙකුට ලැබෙන ලාභ හෝ ඒකක භාර විකිණීමෙන් ලබාගත් ලාභ සහ ලාභාංශ **. [3rd Schedule (rr)]**

[3 වන උපලේඛනයේ අයිතමය (hh) අනුව එය 2021.04.01 දින සිට ක්‍රියාත්මක වේ යැයි උපකල්පනය කෙරේ]

3.2.10 පහත තැනැත්තෙකු විසින් උපයන පොළිය [3rd Schedule (i)] -

- **ඕනෑම පුණ්‍යායතනයක්** - එවැනි ආයතනයක් විසින් නඩත්තු කරනු ලබන නිවසක ළමුන්, වැඩිහිටියන් හෝ ආබාධිතයින් සඳහා සත්කාර සැපයීම කරනු ලබන්නේ නම් පමණි. (මුල් පනතට අනුව)
- **ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තෙකු** (විදේශීය ණය දෙන්නන්) විසින් ශ්‍රී ලංකාවේ ඕනෑම තැනැත්තෙකුට ලබා දී ඇති ඕනෑම ණයක් සඳහා,*
- **ඕනෑම තැනැත්තෙකු**, CBSL හි අනුමැත ඕනෑම වාණිජ/විශේෂිත බැංකුවක විදේශීය මුදල් ගිණුමක තැන්පත් කිරීමෙන්,*
- **ඕනෑම තැනැත්තෙකු,** නම් කරන ලද විදේශ මුදල්වලින් හෝ ශ්‍රී ලංකාවේ රුපියල්වලින් 2020.04.08 දින හෝ ඊට පසුව විදේශ විනිමය පනත යටතේ ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දෙකු සමඟ විශේෂ තැන්පතු ගිණුමක තැන්පත් කිරීමෙන්,*

** කෙසේ වෙනත් නිර්වාසිකයන්ගේ ඉහතින් ආවරණය නොවූ, තැන්පත් පොළී, බද්දට යටත් කිරීමේ හේතුව පැහැදිලි නැත.*

දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

- 2021.04.01 දින හෝ ඊට පසුව ඕනෑම **සුභසාධක සමිතියක්,**
- **ඕනෑම බහුජාතික සමාගමක්** ඕනෑම දේශීය බැංකුවක 2021.04.01 දිනට හෝ ඊට පසු විදේශ මුදල් තැන්පත් කර එම තක්සේරු වර්ෂය සඳහා ආනයන වියදම් පියවා ගැනීම සඳහා පවත්වා ගෙන යන්නේ නම්, එම තැන්පතුව සඳහා.

3.2.11 ඕනෑම මුදලකින් නියම කර ඇති ඕනෑම **ස්වෛරී බැදුම්කරයක් මත නිර්වාසික තැනැත්තෙකු විසින්** උපයා ගන්නා ලද පොලියක්, වට්ටමක් හෝ විකිණීමෙන් ලද ලාභයක්. (w.e.f. 01.04.2018) [3rd Sch. (I)]

3.2.12 ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර ඇතුළු **ඕනෑම විදේශීය මුදල් ස්වෛරී බැදුම්කරයක්** සඳහා ගෙවන ලද හෝ ලබා දෙන පොලී වට්ටම් (w.e.f. 01.04.2018). [3rd Sch. (I)] *(වෙනස් කිරීමක් සහිත මුල් පනතට අනුව)*

3.2.13 2021.04.01 දින හෝ ඊට පසුව ඇමරිකානු ඩොලර් මිලියන 100කට නොඅඩු සමස්ත ආයෝජනයක් සිදු කර ඇති **ශ්‍රී ලංකා අන්තර්ජාතික ස්වෛරී බැදුම්කර** විකිණීමෙන් වාණිජ බැංකුවක් / බලයලත් වෙළෙන්දෙකු විසින් ලබාගත් වාසියක්. [3rd Sch. (II)]

3.2.14 සමෘද්ධි ප්‍රජාව පදනම් කරගත් ඕනෑම බැංකුවක් විසින් 2012.04.01 දින හෝ ඊට පසුව සුරක්ෂිත / භාණ්ඩාගාර බැදුම්කර හෝ භාණ්ඩාගාර බිල්පත්වලින් උපයන ලද හෝ ලබාගත් පොලී හෝ වට්ටම්.

දේශීය ආදායම් (සංශෝධන) පනත
3. බදු නිදහස් ආදායම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

3.2.15 පහත අරමුදලකින් ලැබුනු ඕනෑම මුදලක් ; (on or after 01.04.2018)[3rd Sch. (k)]

- **ඕනෑම තැනැත්තෙකුට** ජනාධිපති අරමුදලෙන් හෝ ජාතික ආරක්ෂක අරමුදලෙන්, (මුල් පනතට අනුව)
- **ඕනෑම රාජ්‍ය සංස්ථාවකට** ඒකාබද්ධ අරමුදලෙන් (පාර්ලිමේන්තුව විසින් වෙන්කළ අරමුදල්වලින්) හෝ රජය විසින් සංවිධානය කරන ඕනෑම ණය මුදලකින්,

සටහන් / උපදෙස්

ඉහත 2.6 (iii) ඡේදයේ විස්තර කර ඇති 3 වන උපලේඛනයේ (ඕ) (iii) යටතේ ආවරණය වන ආයෝජන මණ්ඩල අනුමත සමාගම් හැර, සමාගමක් බදු නිදහස් ලාභයෙන් ප්‍රකාශයට පත් කරන ලාභාංශ ලබන වාසික තැනැත්තන් (වාසික කොටස් හිමියා පුද්ගලයෙකු, සමාගමක් හෝ වෙනත් ආකාරයකින් වේවා) ඔවුන්ගේ ආදායම මත ආදායම් බද්දට යටත් වේ.

එය අසාධාරණ තත්වයක් සහ බදු නිදහස් ලබා දීමේ අපේක්ෂාවන්ගෙන් බැහැරවීමක් පෙන්නුම් කරයි.

දේශීය ආදායම් (සංශෝධන) පනත
4. පස්වාන් Covid-19 ආර්ථික ප්‍රගතිය උදෙසා වූ බදු සහන

TAX TALK
YOUR PARTNER IN TAX

4.1. පස්වාන් Covid-19 ආර්ථික ප්‍රගතිය උදෙසා වූ බදු සහන -[සංශෝධන පනත Sec. 58]

(1) 2019.04.01 දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා CG ගේ වාර්තාවල 2020.06.26 වන දිනට **ඕනෑම කුඩා හා මධ්‍ය පරිමාණ (SME) ව්‍යාපාරයක් විසින් හිඟව පවත්නා වූ යම් ආදායම් බදු මුදලක්** (2019. 03.31 වන දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය දක්වා වාර්තා අනුව ගෙවීමට ඇති බදු හැර) කරන ලද තක්සේරුවක් හේතුවෙන් ඒ හිඟ බදු මුදල පැනනැගී ඇත්නම් (CG විසින් පාලනය කරන යම් බදු පනතක විධිවිධාන සලසා ඇති පරිදි ඒ තැනැත්තා විසින් ආපසු ඉල්ලා සිටින යම් ආපසු ගෙවීමක් ඒ හිඟ ආදායම් බදු මුදල් වලින් අඩු කිරීමට යටත්ව) **CG විසින් ඒ හිඟ ආදායම් බදු මුදල කපා හළ යුතුය.**

(2) තවද 136 වගන්තියට යටතේ හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් කිසිදු වංචාවක් හෝ පැහැර හැරීමක් සිදු කර නොමැති බවට සහ වාර්තාවේ ප්‍රකාශ කර ඇති බද්ද ගෙවා ඇති බවට CG සෑහීමට පත් වන අවස්ථාවකදී AC විසින් 2020.03.31 දිනෙන් අවසන් තක්සේරු වර්ෂය සඳහා ස්වයං තක්සේරුව සංශෝධනය නොකළ යුතුය.

දේශීය ආදායම් (සංශෝධන) පනත
4. පස්වාත් Covid-19 ආර්ථික ප්‍රගතිය උදෙසා වූ බදු සහන (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

පස්වාත් Covid-19 ආර්ථික ප්‍රගතිය උදෙසා වූ බදු සහන -[සංශෝධන පනත Sec. 58](තවදුරටත්)

(3) CG විසින් XVIII වන පරිච්ඡේදය යටතේ පහත සුදුසුකම් සපුරා ඇති තැනැත්තෙකුට එරෙහිව කිසිදු දඩුවමක් හෝ අපරාධ නඩු පැවරීමක් නොකළ යුතුය -

(a) 2021.06.30 දිනට පෙර Y/A 2019/20 සඳහා බදු ප්‍රතිලාභ වාර්තා කිරීම; සහ

(b) Sec. 82 (2) (ඇ) (ii) අනුව Y/A 2019/20 සඳහා අදාළ බදු 30.06.2021 දිනට පෙර ගෙවීම.

සටහන් / උපදෙස්

අළුතින් හඳුන්වා දුන් පශ්චාත් කෝවිඩ් ආර්ථික ප්‍රගතිය උදෙසා වූ බදු සහනය අනුව, වංචාවක් හෝ හිතාමතාම නොසලකා හැරීමක් සිදුවී ඇති බව සනාථ කිරීමට AC ට හැකියාවක් නොමැති නම්, 2019.03.31 දිනට හෝ ඊට පෙර අවසන් වන ඕනෑම ත.ව. සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් 2020.06.26 දිනට ගෙවිය යුතු ආදායම් බදු හිඟ මුදල කපාහැරීම කළයුතු අතර ඒ වෙනුවට තක්සේරු කිරීම් සහ නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් වැළකී සිටිය යුතුය.
CG හෝ AC විසින් එවැනි ක්‍රියාමාර්ගයක් ගන්නේ නම්, බදු ගෙවන්නා ඊට විරුද්ධ විය යුතුය.

දේශීය ආදායම් (සංශෝධන) පනත
5. සහන සහ සුදුසුකම් ලත් ගෙවීම්

TAX TALK
YOUR PARTNER IN TAX

5.1. සහන (5 වන උපලේඛනය) –

(i) 2020.01.01 දින සිට නිර්වාසික ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට සහ වාසික පුද්ගලයන්ට රු. 500,000 වූ පුද්ගලික සහනය, තක්සේරු වර්ෂයකට **රු. මිලියන 3 දක්වා** වැඩි කර ඇත. මෙම පුද්ගල දීමනාව ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලාභයට හිලව් කළ නොහැක.

(ii) රු. 700,000 ක රැකියා දීමනා සහනය 2020.01.01 සිට අහෝසි වේ.

(iii) රු.1,500,000 ක ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පොළී ආදායම් සහනය 2020.01.01 අහෝසි කර ඇත.

(iv) විදේශ මුදල් සේවා සඳහා පුද්ගලයන්ට සහ හවුල්කරුවන්ට ලැබුනු වසරකට රු. මිලියන 15 ක් වූ සහනය 2020.01.01 දින සිට අහෝසි කර, සමස්ත විදේශ ආදායමම නිදහස් කර ඇත.

දේශීය ආදායම් (සංශෝධන) පනත
5. සහන සහ සුදුසුකම් ලත් ගෙවීම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

5.1. සහන (5 වන උපලේඛනය) – (තවදුරටත්)

(v) වාසික පුද්ගලයෙකුට 2020.01.01 දින හෝ ඊට පසු සිදු වූ පහත සඳහන් වියදම් සඳහා වසරකට රු. මිලියන 1.2 ක් දක්වා සහන හිමිවේ ;

- වෛද්‍ය රක්ෂණය ඇතුළු සෞඛ්‍ය වියදම් (තමාගේ),
- දේශීය වශයෙන් දරනු ලබන අධ්‍යාපන වියදම් (දරුවන්ගේ අධ්‍යාපනයද ඇතුළුව),
- නිවාස ණය සඳහා පොළිය,
- අනුමත විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක වීම,
- කොටස් හෝ වෙනත් මූල්‍ය සාදනපත්‍ර මිලදී ගැනීම (Listed Shares/Financial Instruments),

(vi) ඕනෑම වාසික පුද්ගලයෙකු තම පරිශ්‍රය තුල සවි කර ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමට ලබාගෙන ඇති **සූර්ය පැනල** සඳහා වන වියදම වසරකම රු. 600,000 දක්වා;

- එවැනි සූර්ය පැනල සඳහා වන මුළු වියදම හෝ
- එවැනි සූර්ය පැනල අත්පත් කර ගැනීම සඳහා ලබාගත් ඕනෑම ණයක් සඳහා බැංකුවකට ගෙවන ලද මුදල.

දේශීය ආදායම් (සංශෝධන) පනත
5. සහන සහ සුදුසුකම් ලත් ගෙවීම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

5.2. සුදුසුකම් ලත් ගෙවීම් (5th Schedule) -

(i) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තහවුරු කර ඇති පරිදි සමෘද්ධි ප්‍රතිලාභී පවුලක කාන්තාවක් සඳහා වෙළඳසලක් පිහිටුවීම සඳහා වාසික පුද්ගලයෙකු (මුදල් හෝ වෙනත් ආකාරයකින්) කරන දායකත්වය. [5th Sch. item (1)(d)], (w.e.f. 2021.04.01)

(ii) ඕනෑම තැනැත්තෙකු විසින් 2021.04.01 දින හෝ ඊට පසුව සිදුකරන ලද වියදම්;

- ≥Rs. 5 mn වියදමින් චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමේදී, (චිත්‍රපටයේ ප්‍රවර්ධනය ඇතුළුව),
- ≤Rs. 25 mn වියදමින් නව සිනමා ශාලාවක් තැනීම හා උපකරණවලින් සන්නද්ධ කිරීම,
- ≤ Rs. 10 mn පිරිවැයකින් සිනමා ශාලාවක් වැඩි දියුණු කිරීමේදී,

මෙම අඩු කිරීම Y/A හි බදු අය කළ හැකි ආදායමෙන් 1/3 කට සීමා කළ යුතු අතර, අඩු නොකෙරෙන මුදල සඳහා හිමිකම් ඉල්ලීමේ පහසුකම ඉදිරි ආසන්නතම වසර වල දී 1/3 සීමාවන්ට යටත්ව සිදු කළ හැකිය.

දේශීය ආදායම් (සංශෝධන) පනත
5. සහන සහ සුදුසුකම් ලත් ගෙවීම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

(iii) අත්පත් කර ගැනීමේ පිරිවැය හෝ වෙනත් මූල්‍ය ආයතනයක් ඒකාබද්ධ කිරීම සඳහා ඕනෑම මූල්‍ය ආයතනයක් විසින් සිදු කරන ලද වියදම් CBSL විසින් සනාථ කර ඇති පරිදි වසර 3 ක තක්සේරු කාල සීමාවක් තුළ සුදුසුකම් ලැබීමේ ගෙවීමක් ලෙස ප්‍රකාශ කළ හැකිය. (1/3rd per Y/A). AI හි සීමාව හේතුවෙන් ඉතිරිව ඇති මුදල ඉදිරියට ගෙන යා හැකිය. [5th Sch. item (1)(e)] (w.e.f. 2021.04.01)

(iv) **රාජ්‍ය සංස්ථාවක්** විසින් ජනාධිපති අරමුදලට ගෙවන ලද මුදල් සඳහාවූ සුදුසුකම් **සුදුසුකම් ලත් ගෙවීම්** පහසුකම ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලබන මුදල සඳහාද දීර්ඝ කර ඇත. (w.e.f. 2019.04.01) [5th Sch. item(1)(c)].

දේශීය ආදායම් (සංශෝධන) පනත

6. සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – පුද්ගලයින්

TAX TALK
YOUR PARTNER IN TAX

6.1. පුද්ගලයින් (Individuals)

(i) පොලී සහ ලාභාංශ

- පොලී ආදායම සහ ලාභාංශ මත තවදුරටත් WHT නැත.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පොලී ආදායමට තවදුරටත් බදු සහන නැත.

(ii) රැකියා ආදායම (වේතන)

- වේතන මත තවදුරටත් WHT (PAYE) නැත.
- තවදුරටත් රැකියා දීමනාවක් නොමැත. (රු. 700,000 p.a.)
- විශ්‍රාම වැටුප්, පාරිතෝෂික, EPF හෝ අනුමත වන්දි සඳහා බදු සහන.

(iii) බදු සහන සහ සුදුසුකම් සහිත ගෙවීම් (5 වන උපලේඛනය)

- රුපියල් මිලියන 1.2 ක් දක්වා වූ ඇතැම් වියදම් සඳහා නව සහන.(w.e.f. 2020.01.01)
- පුද්ගලික බදු රහිත දීමනාව (සහන) රු. 3 mn දක්වා ඉහළ නංවා ඇත. (w.e.f. 2020.01.01).

දේශීය ආදායම් (සංශෝධන) පනත
6. සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – පුද්ගලයින් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

(iv) පුද්ගලයින්ගේ (වාසික/ නිර්වාසිකයින්) බදු - 2020/21 සිට;

බදු අය කළ හැකි විශ්‍රාමික ප්‍රතිලාභ නොවන ආදායම		බදු අය කළ හැකි විශ්‍රාමික ප්‍රතිලාභ (අනුමත / නියාමනය)	
බදු අය කළ හැකි ආදායම	බදු අනුපාතය	බදු අය කළ හැකි ආදායම	බදු අනුපාතය
පළමු Rs. 3,000,000	6%	පළමු Rs. 10 million	0%
දෙවන Rs. 3,000,000	12%	ඊළඟ Rs. 10 million	6%
ඉතිරිය මත	18%	ඉතිරිය මත	12%

- පුද්ගලයෙකු ඔට්ටු ඇල්ලීම, සූදු කිරීම හා ඕනෑම මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ ආනයනය කිරීම සහ විකිණීම මගින් ලබන ආදායම **40%**ක අනුපාතයකින් බද්දට යටත් වේ.
- මැණික් හා ස්වර්ණාභරණ විකිණීමෙන් සහ විදුලිය සැපයීමෙන් පුද්ගලයෙකු ලබන ලාභ (පුනර්ජනනීය බලශක්ති සම්පත් උපයෝගී කර ගනිමින් ජනනය කරනු ලබන) **14%** ක උපරිමයකට යටත්ව බද්දට යටත් වේ.

සටහන:- වර්තමාන තත්වයන් සමඟ මාසික ආදායම රු. 250,000ට වැඩි සියලුම පුද්ගලයින්;

- *පුද්ගලික බදු ලිපිගොනු වහාම විවෘත කර,*
- *කාර්තුමය ආදායම් බදු ගෙවීම, සහ*
- *පුද්ගල බදු වාර්තා ගොනු කිරීම සිදු කළ යුතුය (ආසන්නතම වර්ෂයේ නොවැම්බර් 30 වන විට).*

දේශීය ආදායම් (සංශෝධන) පනත

7. සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – හවුල් ව්‍යාපාර

TAX TALK
YOUR PARTNER IN TAX

7.1. හවුල්කාරිත්වයන් (Partnerships)

- W.e.f. 2020.01.01, බෙදාවෙන්කල හවුල්කාර කොටස මතවූ 8% ක WHT අහෝසි වේ.
- W.e.f. from 2020.01.01, හවුල්කාරිත්වයේ බදු අය කළ හැකි ආදායම පහත පරිදි බදු වලට යටත් වේ;

බදු අය කළ හැකි ආදායම	බදු අය කළ හැකි ආදායමේ කොටස	බදු අනුපාතය
ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණන කිරීමේ ලාභ ඇත්නම්	ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණන කිරීමේ ලාභ (නිදහස් කළ සීමාවක් නොමැත)	10%
ඉතිරි බදු අය කළ හැකි ආදායම	Rs. 1,000,000 නොඉක්මවන (දක්වා)	0%
- Do -	Rs. 1,000,000 ඉක්මවන	(අතිරික්තය මත පමණි) 6%

දේශීය ආදායම් (සංශෝධන) පනත

8. සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – භාරයන්

TAX TALK
YOUR PARTNER IN TAX

8.1. භාර (Trusts)

- 2020.01.01 දින සිට, භාරයන් සඳහා අදාළ වන බදු අනුපාතය;

  24% සිට 18% දක්වා අඩු කර ඇත.

දේශීය ආදායම් (සංශෝධන) පනත
9. සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – සමාගම්

TAX TALK
YOUR PARTNER IN TAX

9.1. සමාගම් (Companies) අදාළ බදු අනුපාත w.e.f. 01.01.2020:

බදු අනුපාතය	විස්තරය සහ අදාළ අංශය
14%	Sec. 195. * 1 අර්ථ දක්වා ඇති පරිදි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර.
14%	භාණ්ඩ අපනයනය කිරීම ඇතුළු භාණ්ඩ හෝ වෙළඳ භාණ්ඩ විකිණීමේ ව්‍යාපාර, එහිදී ලැබෙන මුදල් විදේශ මුදල්වලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කළ යුතුය.
14%	Sec. 195 *1 අර්ථ දක්වා ඇති පරිදි විශේෂිත කාර්යයන්. (පහත විස්තර කර ඇති පරිදි)
14%	අධ්‍යාපනය, සංචාරක ප්‍රවර්ධනය, ඉදිකිරීම් සේවා, කෘෂි සැකසුම් හා සෞඛ්‍ය සේවා.* 1
14%	වාසික සමාගම් වලින් ලැබෙන ලාභාංශ.
14%	BOI අපනයන සමාගම විසින් සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ හා සමාන නිෂ්පාදන සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ COVID මධ්‍යස්ථානය වෙත සැපයීම. * 1
14%	මැණික් හා ස්වර්ණාභරණ විකිණීමෙන් ලැබෙන ලාභ.

දේශීය ආදායම් (සංශෝධන) පනත

9. සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – සමාගම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

9.1 අදාළ බදු අනුපාත w.e.f. 01.01.2020 (තවදුරටත්):

බදු අනුපාතය	විස්තරය සහ අදාළ අංශය
14%	Y/A 2022/23, 2023/24 සහ 2024/25 වර්ෂ සඳහා 01.01.2021 සිට 31.12.2021 දක්වා CSEහි කොටස් ලැයිස්තුගත කරන සමාගම් (මෙය මෙම පනතේ හෝ වෙනත් ඕනෑම පනතක ඉහළ බදු අනුපාත අය කරන අනෙකුත් සියලුම විධිවිධාන අභිබවා යයි). *1
14%	පුනර්ජනනීය බලශක්ති සම්පත් යොදා ගැනීමෙන් ජාතික විදුලිබල පද්ධතියට ජනනය වන විදුලියෙන් ලැබෙන ලාභය.
18%	නිෂ්පාදනය(ඉහත * 1 ලෙස සලකුණු කර ඇති ව්‍යාපාර වර්ග පහ යටතේ ආවරණය නොවන).
40%	ඔට්ටු ඇල්ලීම සහ සූදු පැවැත්වීම.
40%	ඕනෑම මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක් නිෂ්පාදනය කිරීම, විකිණීම හෝ ආනයනය කිරීම සහ විකිණීම.
10%	ප්‍රාග්ධන ලාභ. (2018.04.01 දින සිට @ 10%)
24%	සමාගමක බදු අය කළ හැකි වෙනත් ආදායමක් මත.

දේශීය ආදායම් (සංශෝධන) පනත
9. සංශෝධිත අයිතම හා ඒවා බලාත්මක වන කාල වකවානු – සමාගම් (තවදුරටත්)

TAX TALK
YOUR PARTNER IN TAX

9.2 සමාගම් සඳහා විශේෂ බදු වට්ටම් :-

පහත දැක්වෙන නව බදු වට්ටම් හඳුන්වා දෙනු ලැබේ w.e.f. 01.04.2021

(i) 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ සිය කොටස් ලැයිස්තුගත කරන ඕනෑම සමාගමක Y / A 2021/22 සඳහා (BOI ගිවිසුම් අනුව ගණනය කරන ලද ආදායම් බද්ද ඇතුළුව) සමස්ථ ප්‍රාග්ධන නොවන ලාභ මත ගෙවිය යුතු ආදායම් බදු සඳහා 50% ක වට්ටමක්.

(ii) ඕනෑම බහුජාතික සමාගමක් විසින් ගෙවනු ලබන ලාභාංශ මත ගෙවිය යුතු ආදායම් බද්දෙන් කොටසක් සඳහා ආදායම් බදු වට්ටම් ලබා දීම;

- Y / A 2021/22 - **25%** බදු සහනය
- Y / A 2022/23 සහ 2023/24 සඳහා - **50%** බදු සහනය

<u>ඉහත සඳහන් වට්ටම් භුක්ති විඳීම සඳහා නිශ්චිත ව්‍යාපාර හැරුණු විට සමාගම් විසින් සපුරාලිය යුතු කොන්දේසි</u>;

(a) Y / A 2020/21 ට වඩා Y / A 2021/22 හි අපනයන 30% කින් වැඩි කිරීම අවශ්‍ය වේ.
(b) Y / A 2020/21 ට වඩා Y / A 2022/23 හි අපනයන 50% කින් වැඩි කිරීම අවශ්‍ය වේ.

(iii) පනතේ 1 වන උපලේඛනයේ සංශෝධනවලට අනුව, කෘෂි ගොවිතැන් නිෂ්පාදනයක් කෘෂි සැකසුම් හෝ නිෂ්පාදන සඳහා යොදා ගන්නේ නම්, එම ක්‍රියාවලියට / නිෂ්පාදනයට අදාළ ලාභයෙන් 25% ක් නිදහස් කර ඇති අතර ඉතිරිය 14% යටතේ බද්දට යටත් වේ.

වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය නම් කරුණාකර අප හා සම්බන්ධ වීමට කාරුණික වන්න .....

TAX TALK
YOUR PARTNER IN TAX

ATHULA RANAWEERA (BSc., FCA, FCMA, FMAAT)
Managing Partner: Ranaweera Associates (Chartered Accountants)
Managing Director - Assent Advisory Partners (Pvt) Ltd.
Assent Secretarial Consultants (Pvt) Ltd.

+94 777 305 123,
athula@ranaweeraasso.lk ***athula@assentadvisory.lk***

Assent Advisory Partners

Assent Secretarial Consultants

Ranaweera Associates
Chartered Accountants